# තනතුරු පුරප්පාඩු

## සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ පහත සඳහන් තනතුරු වල පවතින පුරප්පාඩු සඳහා ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. තාක්ෂණ සහකාර (විදුලිය)

**සේවා ගණය** : MA 2-1 - 2006 A
**වැටුප් පරිමාණය** : රු. 14,610-10x145-07x170-04x240-20x320-24,610

**මූලික අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය පළපුරුද්ද :**

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී,

සිංහල / දෙමළ

ගණිතය

ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම.

(ආ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්වීම.

(ඇ) ජාතික වෘත්තීය කුසලතා (N.V.Q.) සහ (05) මට්ටමට අඩු නොවන්නා වූ විදුලි කාර්මික තාක්ෂණ පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම.

සහ

පිළිගත් ආයතනයක විදුලි කාර්මික ශිල්පියකු ලෙස ද අවුරුදු සේවා කාලයක් සපුරා ප්‍රායෝගික පළපුරුද්ද ලබා තිබීම.

**වයස**

2015.11.30 දිනට අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

### 02. රසායනාගාර සහකාර

**සේවා ගණය** : MA 1-1 - 2006 A
**වැටුප් පරිමාණය** : රු. 13,450-10x145-07x170-04x240-20x320-23,450

**මූලික අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන්**

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී,

සිංහල / දෙමළ

ගණිතය

ඉංග්‍රීසි භාෂාව යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

(ආ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී රසායන විද්‍යාව ඇතුළුව අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

සහ

ඖෂධ / රූපලාවණ්‍ය / ආහාර නිෂ්පාදනය පිළිබඳ රජයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක රසායනාගාර කටයුතු සම්බන්ධයෙන් වසරක පළපුරුද්දක් ලබා තිබීම.

**වයස**

2015.11.30 දිනට අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

### 03 යන්ත්‍ර ක්‍රියාකරු

**සේවා ගණය** : PL 2 - 2006 A
**වැටුප් පරිමාණය** : රු. 12,410-10x130-10x145-10x160-12x170-18,800

**මූලික අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය පළපුරුද්ද :**

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිට අවම වශයෙන් විෂයන් දෙකක් සමත්විය යුතුය.

(ආ) පිළිගත් වෘත්තීය පුහුණු ආයතනයකින් යන්ත්‍ර හා යන්ත්‍ර ක්‍රියාකරවීම සම්බන්ධයෙන් වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරණු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q.) දෙවන හෝ තුන්වන මට්ටමට සරිලන සේ අත්පත් කර ගෙන තිබීම.

සහ

යන්ත්‍ර හා යන්ත්‍ර ක්‍රියාකරවීම පිළිබඳ සම්බන්ධව අවුරුදු 02 (දෙකක) පළපුරුද්ද ලබා තිබීම.

**වයස**

2015.11.30 දිනට අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

***වෙනත්,***

***සෑම ඉල්ලුම්කරුවෙක්ම,***

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ii) තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(iii) විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

**බඳවා ගැනීමේ ක්‍රමය :**

පත්වීම, බලධාරියා විසින් පත් කෙරෙන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනීමේ පටිපාටියට අනුව බඳවාගනු ලැබේ.

පත්වීම්ලාභීන් සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. සේවා යෝජකයාගෙන් 12% කි. සේවකයාගෙන් 8% කි. සේවා යෝජකයාගෙන් පත්වීම් ලාභියාගේ වැටුපෙන් 3% ට සමාන මුදලක් සේවා නියුක්තියන්ගේ භාර අරමුදලට ගෙවනු ලැබේ.

රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් ස්වකීය අදාළ ආයතන වල ප්‍රධානීන් මාර්ගයෙන් යොමුකළ යුතුය. අයදුම්කරුවන්ගේ සම්පූර්ණ ජීව දත්ත සහ අදාළ සහතික වල, සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පතට අමුණා තිබිය යුතුය. සහතික වල පිටපත් අමුණා නොමැති අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

තමා විසින් පිළියෙල කරගත් අයදුම්පතක් සභාපති, ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව, නො. 94, පරණ කොට්ටාව පාර, නාවින්න, මහරගම යන ලිපිනයට 2015.11.30 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඔබගේ දුරකථන අංකය හා ඔබ ගැන විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ ලිපිනයන් සහ දුරකථන අංකයන් අයදුම්පතෙහි සඳහන් කර තිබිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

තැපැලේදී අස්ථානගතවන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳ අප සංස්ථාව වගකියනු නොලැබේ.

**සභාපති,**
**අංක. 94, ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව,**
**පරණ කොට්ටාව පාර, නාවින්න, මහරගම.**
**දු. ක. අ. 011-2851610**